# STATEMENT OF PRODUCTION COST

# නිෂ්පාදන පිරිවැය

යම් නිශ්චිත කාලච්ඡේදයක යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය සඳහා දරන ලද වියදම්වල එකතුව යි.

# නිෂ්පාදන පිරිවැය මූලිකාංග




වක්‍ර පිරිවැය නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය නමින් ද හඳුන්වයි.

## සෘජු නිෂ්පාදන පිරිවැය (ප්‍රාථමික පිරිවැය)

යම් නිෂ්පාදිත ඒකකයක් සමග සෘජුවම හඳුනාගත හැකි පිරිවැය යි.

මේවා කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා සෘජු ව ම අදාළ වේ.

සෘජු පිරිවැය එහි මූලිකාංග අනුව කොටස් තුනකි.

- **සෘජු ද්‍රව්‍ය පිරිවැය** - නිෂ්පාදනය කරන ලද භාණ්ඩය තුළට අන්තර්ගතවන භාණ්ඩ ඒකකයක් සමග පැහැදිලි ව හඳුනාගත හැකි භෞතික සම්පත්වල වටිනාකමයි.

  උදා : පොත් මුද්‍රණ ආයතනයක් භාවිත කරන කඩදසි හා තීන්ත

- **සෘජු ශ්‍රම පිරිවැය** - කිසියම් භාණ්ඩයක් නිපදවීම සඳහා සෘජු ව ම සහභාගී වන ශ්‍රමිකයන්ට ගෙවන වැටුප් සහ සේවකයන්ට කරන ගෙවීම් සියල්ලයි.

  උදා : පොත් මුද්‍රණ සේවකයන්ට ගෙවන වැටුප්

ClassWork.LK

- **වෙනත් සෘජු පිරිවැය -** භාණ්ඩ ඒකකයක් නිපදවීමේ දී සෘජු ව හඳුනාගත හැකි ද්‍රව්‍ය පිරිවැයට හා ශ්‍රම පිරිවැයට අමතර ව සෘජුවම යොදා ගන්නා වෙනත් දේ සඳහා දරනු ලබන වියදම් ය.

  උදා : පොත් කතෘවරයාට ගෙවන කතෘ භාගය

| |
|---|
| ප්‍රාථමික පිරිවැය = සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + වෙනත් සෘජු පිරිවැය |

ClassWork.Lk

උදා :

| | | |
|---|---|---|
| | | රු. |
| සෘජු ද්‍රව්‍ය (මුද්‍රණ කඩදාසි හා තීන්ත) | = | xx |
| සෘජු ශ්‍රමය (මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු වැටුප) | = | xx |
| වෙනත් සෘජු (කතුවරයාට ගෙවන කතෘභාගය) | = | xx |
| ප්‍රාථමික පිරිවැය | | xxx |

# නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (වක්‍ර පිරිවැය)

නිෂ්පාදන ඒකකයට අදාළ ව පැහැදිලි ව හඳුනාගත නොහැකි සමස්ත නිෂ්පාදනය වෙනුවෙන් දරන වියදම් ය.

ප්‍රාථමික පිරිවැය හැරුණු විට නිෂ්පාදන කටයුත්තට අදාළ ව දරන අනෙකුත් වියදම් සියල්ල මීට අයත් වේ.

නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය එහි මූලිකාංග අනුව කොටස් තුනකි.

- **වක්‍ර ද්‍රව්‍ය පිරිවැය -** නිෂ්පාදන ඒකකයට අදාළ ව සෘජු ව ම හඳුනාගත නොහැකි ද්‍රව්‍ය සඳහා දරන වියදම් ය.

  උදා : පොත් මුද්‍රණ යන්ත්‍රයට යොදන ලිහිසි තෙල්

- **වක්‍ර ශ්‍රම පිරිවැය -** නිෂ්පාදන කටයුත්තකට සෘජු ව ම සම්බන්ධ කළ නොහැකි ශ්‍රමය සඳහා දරන වියදම් ය.

  උදා : කර්මාන්ත ශාලාවේ අධීක්ෂණ නිලධාරින්ට ගෙවන වැටුප් සහ ලිපිකරුවන්ට ගෙවන වැටුප්

ClassWork.LK

- **වෙනත් වක්‍ර පිරිවැය -** නිෂ්පාදන ඒකකයට අදාළ ව ඍජු ව ම සම්බන්ධ කළ නොහැකි වක්‍ර ද්‍රව්‍ය පිරිවැයට හා වක්‍ර ශ්‍රම පිරිවැයට අමතර ව දරන අනෙකුත් වියදම් සියල්ල                යි.

  උදා : කම්හල් කුලී

| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය = වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රම පිරිවැය + වෙනත් වක්‍ර පිරිවැය |
|---|

උදා :

| | | රු. |
|---|---|---|
| වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | = | xx |
| වක්‍ර ශ්‍රම පිරිවැය | = | xx |
| වෙනත් වක්‍ර පිරිවැය | = | xx |
| පොදු කාර්ය පිරිවැය | = | xxx |

ClassWork.LK

# නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම

## මුළු නිෂ්පාදන පිරිවැය

කිසියම් භාණ්ඩයක් නිපදවීම සඳහා දරන ලද මුළු වියදම යි.

මුළු නිෂ්පාදන පිරිවැය = ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

## නිෂ්පාදන ඒකක පිරිවැය

කිසියම් නිෂ්පාදිතයකට අදාළ ව එක් ඒකකයක් නිපදවීම සඳහා වැයවන පිරිවැය යි.

$$\text{ඒකක පිරිවැය} = \frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදන ඒකක ප්‍රමාණය}}$$

## ඒකකයක ලාභාන්තිකය

නිෂ්පාදන ආයතනයක් සිය නිෂ්පාදිත වෙළෙඳපළට ඉදිරිපත් කිරීමේ දී පිරිවැයට යම් අගයක් එකතු කරනු ලබන අතර එය ලාභාන්තිකය යි.

| | | |
|---|---|---|
| ලාභාන්තිකය ↑ | මිල ↑ | ගැනුම්කරුවන් ↓ |
| ලාභාන්තිකය ↓ | මිල ↓ | ගැනුම්කරුවන් ↑ |

## ඒකකයක විකුණුම් මිල

නිෂ්පාදිත ඒකකයක් වෙළෙඳපළට ඉදිරිපත් කරන මිල යි.

ඒකකයක විකුණුම් මිල = ඒකක පිරිවැය + ඒකක ලාභාන්තිකය

ClassWork.LK

## <u>නිෂ්පාදිතයක මිල නියම කිරීමේ දී සලකා බලන සාධක</u>

- පිරිවැය
- භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම
- වෙළෙඳපළ තුළ පවතින සමාන භාණ්ඩවල හා ආදේශන භාණ්ඩවල මිල ගණන්
- ආයතනයේ මිල කිරීමේ පරමාර්ථ
- නීතිමය සාධක

ClassWork.LK

# පිරිවැය ලේඛනයක ආකෘතිය

රණමයුර ව්‍යාපාරය
20XX දෙසැම්බර් මාසය සඳහා
පිරිවැය ලේඛනය

| | | |
|---|---|---|
| ප්‍රාථමික පිරිවැය | | |
| සෘජු ද්‍රව්‍ය - දැව | 120 000 | |
| සෘජු ශ්‍රමය - වඩු කාර්මික වැටුප | 40 000 | |
| සෘජු වෙනත් පිරිවැය | 15 000 | 175 000 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | | |
| වක්‍ර ද්‍රව්‍ය - ඇණ හා පොලිෂ් | 5 000 | |
| වක්‍ර ශ්‍රමය - සුපරීක්ෂක වේතන | 30 000 | |
| වක්‍ර වෙනත් වියදම් - කම්හල් කුලී | 12 000 | |
| ඉන්ධන හා විදුලිය | 8 000 | |
| කම්හල් රක්ෂණය | 14 000 | |
| යන්ත්‍ර ක්ෂය | 6 000 | 75 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | | 250 000 |

ClassWor

## පරිගණක පැතුරුම්පත් මගින් පිරිවැය ලේඛන සකස් කිරීමේ පියවර

01. පරිගණක Excel worksheet එකක් විවෘත කර ගන්න.

02. එහි පිරිවැය ලේඛනයක් සකස්කර ගන්න.

03. ප්‍රාථමික පිරිවැය හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ මුළු එකතුව ලබා ගැනීමට (Σ) හෝ (sum) විධානයක් භාවිත කරන්න.

04. ඒකක පිරිවැය ගණනය කිරීම සඳහා මුළු පිරිවැය හා නිෂ්පාදිත ඒකක ගණන ඇතුළත් කර එය බෙදීමට අදාළ විධානය ලබා දෙන්න.

Class Work LK

ClassWork.LK